

# කියවීමේ රුචිය වර්ධනය කරමු

**නාමලී සුරවීර**
**කථිකාචාරිනී පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

*දැනුම ආලෝකයක් බඳුය. එය සැහැල්ලු ය. ස්පර්ශ කළ නොහැක. ලොව පුරා සැරිසරමින් එහි වෙසෙන සෑම මිනිසකුගේ ම ජීවිත දීප්තිමත් කරවීමේ ප්‍රබල ශක්තියක් දැනුම සතු වේ.*

දැනුම වර්ධනය කර ගැනීම සඳහා 'කියවීම' අත්‍යවශ්‍ය ය. එනිසා ළමා කල සිටම පොතපත කියවීමට පුරුදු පුහුණු කරවීම ඉතා වටී. 'කියවීම' අඛණ්ඩ අධ්‍යාපන ක්‍රියාවලියේ අනිවාර්යය අංගයක් බව ද මෙහි දී අමතක කළ යුතු නොවේ. ලොව ප්‍රසිද්ධ මනෝවිද්‍යාඥයින් 'කියවීම' අර්ථ නිරූපණය කර ඇත්තේ, "කියවීම යනු කියවන්නා ගේ සම්පූර්ණ අත්දැකීම්වලට ගැලපෙන පරිදි කියවීම් පාඨයේ අර්ථයත් සංජානනය කිරීම ග්රේ, යනුවෙනි.

හෙට දින ලෝකය බාර ගන්නට පෙරට එන අද පාසල් යන දරු කැළ ප්‍රාඥයන්, විශිෂ්ටයන් කිරීමට පාසල් පද්ධතිය සතු කාර්යභාරය සුළු පටු නොවේ. නූතන පාසල් අධ්‍යාපනය ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයට මාරු වීම තුළ පාසල් සිසුන් විසින් ඔවුන් ගේ නිර්මාණශීලීත්වය, තොරතුරු කුසලතා ආදිය වර්ධනය කරගත යුතුව තිබේ. පංති කාමරයේ ඉගැන්වෙන විෂය මාලා සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමටත්, ඉන් පරිබාහිර තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමටත් 'කියවීම' වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය ය. පාසල් පරිසරය තුළින් කියවීමට හුරු නොවන දරුවා පාසල් අධ්‍යාපනය හමාර කර උසස් අධ්‍යාපනය සඳහා හෝ රැකියා අවස්ථා සඳහා පිය මැන්න ද ඔහු ගේ හෝ ඇය ගේ එම දුර්වලතාව තමාගේ සෙවණැල්ල මෙන් පසුපසම ගමන් කරනු වැළකිය නොහේ. ඒ හුරුවීම පුද්ගල ජීවිත තුළට ප්‍රවේශ විය යුත්තේ මුල් කාලීන අවස්ථාවේ මිස අතු ලියලා මහ වෘක්ෂයක් බවට පත් වූ පසු නොවේ. එනිසා සිසුන් ගේ කියවීමේ රුචිය වර්ධනය කිරීමට විදුහල්පති ප්‍රමුඛ ගුරු මණ්ඩලය හා පාසල් පුස්තකාලයාධිපති නිරන්තර වගකීමකින් කටයුතු කිරීම රටේ ලෝකයේ අනාගත සුභසිද්ධියට හේතුවක් වනු නො අනුමානය.

පාසල් පද්ධතිය තුළ සිසුන් කියවීමට හුරුකරවිය හැකි නාභි මධ්‍යස්ථානය පාසල් පුස්තකාලය යි. එය සිසුන් ගේ තොරතුරු අවශ්‍යතා නිරූපණය කරන ඔවුන් වෙනුවෙන් ම කැප වූ ස්ථානයක් බව ඒත්තු ගැන්විය යුතු වේ. එවිට සිසුන් නිතරම පාසල් පුස්තකාලය හා ගනුදෙනු කිරීමට පෙලඹේ. නොඑසේ නම් සිදුවනුයේ පාසල් පුස්තකාලය සිසුන් ගේ භාවිතයෙන් තොර හුදකලා ස්ථානයක් බවට පත් වීමයි.

අද බහුතරයක් පාසල් පුස්තකාලයන්ට සිදුව ඇත්තේ ද එයයි. සැබවින්ම පුද්ගල ජීවිතයක පුස්තකාල භාවිතයේ ආරම්භක අවස්ථාව පාසල නිසා කාර්යක්ෂමව පොත් හා පුස්තකාලය භාවිත කරන්නේ කෙසේ ද ? කියවීමේ රුචිය වර්ධනය කරන්නේ කෙසේද යන්න පිළිබද පාසල් පුස්තකාලයාධිපති විසින් විශේෂ අවධානයක් යොමු කිරීම මෙහිදී වැදගත් වේ.

පාසල් සිසුන් පුස්තකාලය වෙත ගෙන්වා ගැනීමට දෛනිකව අලුත්වන තොරතුරු එකතුවක් වර්ධනය කිරීම අත්‍යවශ්‍යය ය. එහිදී, සිසුන්ගේ විෂය නිර්දේශයට අදාළ අතිරේක කියවීම ද්‍රව්‍ය එකතුවක් ඒ ඒ වයස් මට්ටම්වලට අදාළ ව කියවිය හැකි නව දැනුම රැගත් පොත පත හා ඒ ඒ අවධීන් සංවර්ධනයට උචිත පොත් එකතුවක් සංවර්ධනය කළ යුතු වේ.

එලෙසම පාසල් පුස්තකාලයක ළමුන්ට කියවීමට උචිත නොවන පොත පත කිසිඳු හෙයකින් රාක්ක මත නො තැබිය යුතු වේ. එනම්, · දුර්වල භාෂාවකින් රචිත පොතපත · විශ්වාස තැබිය නො හැකි සිදුවීම් රැගත් පොතපත. · විශේෂයෙන් භූගෝලය,ඉතිහාසය,හා විද්‍යාව, සම්බන්ධ වැරදි තොරතුරු ඇතුලත් ග්‍රන්ථ. · කාණ්ඩ 1,2,3,... ආදී දීර්ඝ මාලා ප්‍රකාශන . · පහත් අදහස් ,අතිශය සංවේදනීය කථා පුවත් හා මිනී මැරුම් සම්බන්ධිත තොරතුරු අතුළත් පොතපත පාසල් පුස්තකාලයට ප්‍රවේශ වී නොතිබිය යුතුය.

ගුණාත්මක හා ප්‍රමාණාත්මක එකතුවක් පාසල් පුස්තකාලය තුළ සංවර්ධනය කිරීමෙන් අනතුරු ශිල්පීය කියවීමකට සිසුන් උනන්දු කරවිය යුතුය. බහුතරයක් දෙනා සිදුකරන්නේ සාමාන්‍ය කියවීමයි. අධ්‍යාපනය හදාරන්නවුන් හුරුකරවිය යුතු වන්නේ ශිල්පීය කියවීමකට ය. ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් කැමැත්තෙන් කියවීමට ලද පුහුණුව හෝ අරමුණක් සඳහා කියවීම ශිල්පීය කියවීම යි.

නවීන තාක්ෂණයේ ආගමනයත් සමගින් කියවීම පෙළ කියවීම හා තිරය කියවීම වශයෙන් ද්විත්ව කාරණය වී තිබේ. මුද්‍රිත පොත පත කියවීම පෙළ කියවීම වශයෙන් ද පරිගණකය,රූපවාහිනිය ආදිය ඇසුරින් තොරතුරු ගවේෂණය තිරය කියවීම ද වේ.

පාසල් සිසුන් අතර ශිල්පීය කියවීම ආකාර කිහිපයකින් ප්‍රගුණ කළ හැක. ඉන් පළමුවැන්න නිශ්ශබ්දව කියවීම හා නිදහස් කියවීමයි. (Silent reading and free reading)දෙවැන්න පිටපත් කිහිපයක් සංසන්දනය කර බලා කියවීමට හුරු කිරීමයි. (Collateral Reading) තෙවැන්නBrowsing Skimming සහ Scanningවශයෙන් තෙ ආකාරයකින් කියවීම ප්‍රගුණ කිරීමයි. අරමුණ අදහස හඳුනාගනිමින් ගැඹුරින් කියවීම Browsingලෙස හැඳින්වේ. ක්ෂණිකව ඇස යොමුවන ස්ථාන වෙත අවධානය යොමුකර අදහස තේරුම් ගැනීම Skimmingවේ. බීජ පද හා ශීර්ෂවල අන්තර්ගත විශේෂිත තොරතුරු ඔස්සේ කියවීමScanningනම් වේ.

ශිල්පීය වශයෙන් කියවීමට පාසල් සිසුන් තුළ කියවීම ප්‍රවර්ධනය සඳහා විශේෂිත වැඩපිළිවෙල දියත් කිරීම වැදගත් වේ. එහි ලා පාසල් පුස්තකාලයට කළ හැකි කර්තව්‍යයන් රැසකි. ඒ අතුරින් කියවීමේ පුරුදු ඇති කරවන තරඟ සංවිධානය කළ හැක. සිසුන් ගේ කියවීමේ ස්වභාවය පරීක්ෂාවට ලක් කිරීමෙන් ද ඔවුන් තුළ කියවීමට උනන්දුවක් ඇති කළ හැක. සිසුන් ගේ කියවීම ඇගයීම් වස් පුස්තකාල දින පොතක් පවත්වාගෙන යා හැක.(Literary activities – Library Reading cumulaltive Record Card Library diary )එකී වාර්තා දිනෙන් දින මාසයෙන් මාසය හෝ වසරින් වසර අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. මෙවැනි වැඩසටහන් යටතේ දෙමාපිය ගුරු සිසු සබඳතා ද වර්ධනය වේ. පොත් හුවමාරු කර ගැනීමේ කටයුතු ද (Book Sharing Activities)කියවීම ප්‍රවර්ධනය කරයි.

වයස අවුරුදු 10 – 12 කාණ්ඩයේ වන සිසුන් ගේ කියවීම ප්‍රවර්ධනය සඳහා පොත් සංග්‍රාම වැඩසටහන් (Battle of the books)සංවිධානය කිරීම සුදුසු වේ. මෙහිදී පාසල් පුස්තකාලයාධිපති විසින් ප්‍රබන්ධ 10 ක් හෝ 15 ක ලැයිස්තුවක් පිළියෙල කර පංති වශයෙන් පුස්තකාලයට පැමිණෙන සිසුන් කණ්ඩායම් කර, ලැයිස්තුවේ සඳහන් පොත් කියවා අවසන් කිරීමට සති කිහිපයක කාලයක් ලබා දේ. අනතුරු ඒ එක් පොතකින් 10 බැගින් වන පරිදි ප්‍රශ්න පිළියෙල කර ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් මෙහෙයවිය හැක. එහිදී වැඩිම ලකුණු ලබාගන්නා කණ්ඩායමට ත්‍යාග සහ සහතික පත් ප්‍රදානයක් ද සිදුකළ හැක. මෙවැනි ක්‍රියාකාරකම් ඔස්සේ ළමුන් චක්‍රාකාරයෙන් කියවීමට යොමු කිරීමට අවස්ථාව උදකරගත හැකි වේ.

වයස අවුරුදු 9 – 14 වයස් කාණ්ඩ සඳහා පුස්තකාල ප්‍රහේලිකා වැඩසටහන් (Library Trivia) වඩාත් සුදුසු ය. එමඟින් විශ්වකෝෂ ආදී විමර්ශන මූලාශ්‍ර භාවිතය පිළිබඳ මූලික අවබෝධයක් ලබා දිය හැකි වේ. නිවැරදිව පුස්තකාල භාවිතය පිළිබඳ ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීමට පාඨක අධ්‍යාපන වැඩසටහන් දියත් කිරීම ඉතා සුදුසු ය. පොත්පත් තෝරා ගැනීම, පමුද්ධරණය කරගත් තොරතුරු සටහන් කර ගැනීම ආදී වූ කරුණු රැසක් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීමට එහෙයින් අවස්ථාව උදා වනු ඇත.

උක්ත හඳුනාගත් පිරිදි සිසුන් ගේ කියවීමේ රුචිය වර්ධනය සඳහා පාසල් පුස්තකාලයාධිපති හා විදුහල්පති ප්‍රමුඛ ගුරු මණ්ඩලය විසින් ලබාදිය යුතු දායකත්වය මෙන්ම සිසුන් විසින් ද ස්වයං උත්සාහයක් ඒ සඳහා දැරිය යුතු වේ. ඒ සඳහා තමා ජීවත්වන වටපිටාව තුළ පොත අනිවාර්ය සාධකයක් කර ගැනීම ඉතා වැදගත් ය. කියවීම සඳහා දවසේ නිශ්චිත කාලවේලාවක් වෙන් කර ගැනීම සිසුන් විසින් අවධානය යොමු කළ යුතු තවත් කරුණකි. කියවීම සඳහා රූපවාහිනිය, ගුවන් විදුලිය බාධාවක් නම් එවැනි මාධ්‍ය සඳහා දෛනික දින චර්යාවෙන් වෙනම කාලයක් වෙන් කර තමා ගේ අවශ්‍යතා පරිදි කියවීමට ප්‍රමාණවත් කාලයක් වෙන් කර ගත යුතු වේ. විටෙක කියවීම වෙහෙසකර කටයුත්තක් වේ නම් ශාස්ත්‍රීය සංවාදාත්මක වැඩසටහනකට සවන්දීම ද යෝග්‍යය ය. පාසලේ මිතුරු කැල හෝ අසල්වැසියන් සමඟ කියවීම් සමාජයක් පිහිටුවා ගැනීම තවත් ප්‍රයෝජනවත් කටයුත්තකි. (Reading group or book club )සෑම සිසුවෙක් විසින් ම Dearකාලයක් පුද්ගලික වශයෙන් සකස් කර ගැනීම වැදගත් වේ. DearයනුDrop Everything and Readකියවීමේ රුචිය වර්ධනය කර ගැනීම සඳහා ස්වෝත්සාහයෙන් කටයුතු කිරීම අන් සියල්ලටම වඩා අගණේය යනුයි.

"If you choose to make reading your constant companion you 'll never walk alone. Beside you 'll have more to discover in life than you'd ever thought about. think about it in some bright corner of the would there's some book waiting for you"

ජාතිය භාරගන්නට පෙරට එන රටේ සිසු පරපුරේ කියවීමේ රුචිය වර්ධනය කිරීමෙන් නෙළා ගත හැකි ඵල මේ යැයි කිව නොහේ. තොරතුරු ලෝකයක ජීවත්වන අපට දැන් 'කියවීම' යනු අත්‍යවශ්‍ය පුරුදු පුහුණු විය යුතු ගුණාංගයකි. ඒ බැව් සමස්ත ලෝකය විසින් දැන් අවධාරණය කර ගෙන හමාරය. ❒